**දෙවන සෞඛ්‍ය අංශ සංවර්ධන ව්‍යාපෘතිය - සංරචක - II - 2018**

---------------------------------------------------------------------------

දෙවන සෞඛ්‍ය අංශ සංවර්ධන ව්‍යාපෘතියේ - සංරචක II හි, 2018 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජය සහ ජාත්‍යන්තර සංවර්ධන සංගමය අතර 2013 අගෝස්තු 19 දින එළඹි අංක 5228 - එල්කේ දරන මූල්‍ය ගිවිසුම සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවෙහි ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත්කළ යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ.

## 1.2 ක්‍රියාත්මක කිරීම, අරමුණු, අරමුදල් යෙදවීම හා ව්‍යාපෘති කාලය

----------------------------------------------------------------------

මූල්‍ය ගිවිසුම අනුව, එවකට සෞඛ්‍ය අමාත්‍යාංශය වර්තමානයේ සෞඛ්‍ය, පෝෂණ හා දේශීය වෛද්‍ය අමාත්‍යාංශය විසින් ජාතික මට්ටමේ ව්‍යාපෘතියේ කාර්යයන් ක්‍රියාත්මක කිරීම අපේක්ෂා කෙරෙන අතර පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යාංශය විසින් පළාත් මට්ටමේ ව්‍යාපෘති කාර්යයන් සිදුකිරීම අපේක්ෂා කෙරේ. ව්‍යාපෘති ශක්‍යතා ලියවිල්ල අනුව, 2013 සිට 2017 වර්ෂය දක්වා ජාතික සෞඛ්‍ය සංවර්ධන සැලැස්ම ක්‍රියාත්මක කිරීමට මූල්‍ය සහාය සැපයීම සඳහා මෙම ව්‍යාපෘතිය ක්‍රියාත්මක කෙරේ. මන්ද පෝෂණය හා බෝ නොවන රෝග පිළිබඳ අභියෝග සඳහා යහපත් ප්‍රතිචාර දැක්වීමට හැකිවන පරිදි මහජන සෞඛ්‍ය පිළිබඳ කාර්යසාධන ප්‍රමිතීන් වැඩිදියුණු කිරීම ව්‍යාපෘතියේ අරමුණ වේ. මූල්‍ය ගිවිසුම අනුව, ව්‍යාපෘතියේ ඇස්තමේන්තුගත මුළු පිරිවැය රු.මිලියන 25,270 කට සමාන විගැහි මිලියන 129.80 ක් (එක්සත් ජනපද ඩොලර් මිලියන 200 ක්) වන අතර ඉන් රු.මිලියන 1,263.50 කට සමාන විගැහි මිලියන 6.50 ක් (එජඩො මිලියන 10 ක්) ව්‍යාපෘතියේ සංරචක-II යටතේ සිදුකළ යුතු කාර්යයන් සඳහා වෙන්කර තිබුණි. ව්‍යාපෘතිය එහි කටයුතු 2013 ජූලි 01 දින ආරම්භ කර තිබුණු අතර, 2018 සැප්තැම්බර් 30 දින වන විට නිම කිරීමට නියමිතය. සෞඛ්‍ය, පෝෂණ හා දේශීය වෛද්‍ය අමාත්‍යාංශය විසින් ජාතික මට්ටමින් ව්‍යාපෘතියේ සංරචක-II යටතේ සිදු කරන ලද කාර්යයන් පිළිබඳ අදහස් දැක්වීම් මෙම වාර්තාවේ අඩංගු වේ.

## 1.3 මතය

-------

ව්‍යාපෘතියේ 2018 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා මූල්‍ය කාර්යසාධනය සහ එහි මුදල් ප්‍රවාහ ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

## 1.4 මතය සඳහා පදනම

--------------------

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර) අනුකූලව මා විගණනය සිදු කරන ලදී. මෙම විගණන ප්‍රමිති යටතේ වූ මාගේ වගකීම, මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

## 1.5 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ සහ ඊට සම්බන්ධ පාර්ශවයන්ගේ වගකීම්

----------------------------------------------------------------------------------------------

මෙම මූල්‍ය ප්‍රකාශන පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව පිළියෙල කිරීම හා සත්‍ය හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය

ප්‍රකාශයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍ය යැයි කළමනාකරණය තීරණය කරනු ලබන අභ්‍යන්තර පාලනයන් තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.
ව්‍යාපෘතියේ මූල්‍ය වාර්තාකරණ ක්‍රියාවලිය සම්බන්ධ වගකීම, පාලනය කරන පාර්ශවයන් විසින් දරනු ලබයි.

## 1.6 මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම

සමස්තයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා සහ වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණකගේ වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සැමවිටම ප්‍රමාණාත්මක අවප්‍රකාශනයන් අනාවරණය කරගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක අවප්‍රකාශනයන් ඇතිවිය හැකි අතර, මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කරගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි බලපෑමක් විය හැකි බවට අපේක්ෂා කෙරේ.
මා විසින් වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය කරන ලදී. තවද,

- වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගේ අවදානම් හඳුනාගැනීමේදී හා තක්සේරු කිරීමේදී අවස්ථාචෝචිතව උචිත විගණන පටිපාටි සැලසුම් කිරීමෙන් වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවන්නා වූ අවදානම් මඟහරවා ගැනීමට, ප්‍රමාණවත් සහ සුදුසු විගණන සාක්ෂි ලබා ගැනීම මාගේ මතයට පදනම් වේ. ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදු වන්නා වූ බලපෑම ප්‍රබල වන අතර, දූස්සන්ධානය, ව්‍යාජ ලේඛන සැකසීම, චේතනාන්විත මඟහැරීම හෝ අභ්‍යන්තර පාලනයන් මඟහැරීම වංචාවක් ඇතිවීමට හේතුවේ.

- අවස්ථාචෝචිතව උචිත විගණන පටිපාටි සැලසුම් කිරීම පිණිස ව්‍යාපෘතියේ අභ්‍යන්තර පාලනය සම්බන්ධයෙන් අවබෝධයක් ලබා ගන්නා ලද නමුත්, අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳ මතයක් ප්‍රකාශ කිරීමට අදහස් නොකරයි.

- භාවිතා කරන ලද ගිණුම්කරන ප්‍රතිපත්තිවල සහ ගිණුම්කරණ ඇස්තමේන්තුවල සාධාරණත්වය සහ කළමනාකරණය විසින් කරන ලද සම්බන්ධිත හෙළිදරව් කිරීම්වල යෝග්‍යතාවය අගයන ලදී.

- හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල ඉදිරිපත් කිරීම, ව්‍යුහය සහ අන්තර්ගතය ඇගයීමට ලක්කළ අතර, ඒ සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණ අයුරින් මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත් බව අගයන ලදී.

මාගේ විගණනය තුළදී හඳුනාගත් වැදගත් විගණන සොයාගැනීම්, ප්‍රධාන අභ්‍යන්තර පාලන දුර්වලතා හා අනෙකුත් කරුණු පිළිබඳව පාලනය කරනු ලබන පාර්ශවයන් දැනුවත් කරන ලදී.

**2.** **භෞතික කාර්යසාධනය**

**2.1** **ව්‍යාපෘති ක්‍රියාකාරකම්වල භෞතික ප්‍රගතිය**

| කාර්යය | විගණන නිරීක්ෂණය | බලපෑම | කළමනාකරණයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|---|
| HPV / DNA පරීක්ෂණය ජාතික ගැබ්ගෙල පිළිකා නිවාරණ වැඩසටහනට ඇතුළත් කිරීමේ ශක්‍යතාව සහ හැකියාව ඇගයීම් කිරීම සඳහා වූ නියමු අධ්‍යයනය. | අදාළ පර්යේෂණ කටයුතු 2018 සැප්තැම්බර් 30 දිනට පෙර අවසන් කිරීමට එකඟ වූ අතර පර්යේෂණ කාලය තුළ පරීක්ෂා කිරීමට සැලසුම් කර ඇති සාම්පල 10,000 න් 2019 අගෝස්තු 31 දින වන විටත් සාම්පල 8,635 ක් පමණක් පරීක්ෂා කර තිබුණි. එබැවින්, ශ්‍රී ලංකාවේ ගැබ්ගෙල පිළිකා පරීක්ෂා කිරීමේ මූලික ක්‍රමයක් ලෙස කෝබාස් 4800 HPV / DNA පරීක්ෂණ ඇතුළත් කිරීමෙන් පරීක්ෂණ සිදු කිරීමේ හැකියාව තීරණය කිරීමේ පර්යේෂණ කටයුතු අවසන් කර නොතිබුණි. HPV / DNA පරීක්ෂණ යොදාගැනීමේ හැකියාව ඇගයීම් කිරීම සඳහා උපකරණ මිලදී ගැනීමට සහ අධ්‍යයන චාරිකාවක් සඳහා විදෙස් ගත වීමට පහසුකම් සැපයීම සඳහා ව්‍යාපෘතිය මගින් රු.මිලියන 41 ක් වැය කර ඇති බව නිරීක්ෂණය විය. | අපේක්ෂිත ව්‍යාපෘති ඉලක්ක සපුරා ගත නොහැකිවනු ඇත. | අවසන් වාර්තාව හැකි ඉක්මනින් නිකුත් කරන ලෙස අදාළ නිලධාරීන්ට උපදෙස් දීමට පියවර ගනු ලැබේ. | ව්‍යාපෘති කාලය තුළ අපේක්ෂිත ඉලක්ක සපුරා ගත යුතුය. |